## පළමුවන කියැවීම

ක්‍රියා 10:25-26, 34-35, 44-48

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයකි.

**සියල්ලන් කෙරෙහි ශුද්ධාත්මයාණන් වහන්සේ පහළ වූ සේක.**

පේදුරු ගෙට පිවිසුණු විට කොර්නේලියස් ඔහු ඉදිරියට ගොස් ඔහුගේ පාමුල වැඳ වැටුණේය. එහෙත් පේදුරු, "නැගිටින්න, මමත් මනුෂ්‍යයෙකු"යි කියා ඔහු එසෙව්වේය. එවිට පේදුරු මෙසේ කීය. "දෙවියන් වහන්සේ මිනිසුන්ගේ තරාතිරම් නොබලන බව දැන් මට සැබැවින්ම පැහැදිලිය. සියලු ජාතීන් අතර උන්වහන්සේ කෙරෙහි බිය ඇති, හරි දේ කරන තැනැත්තා උන්වහන්සේට ප්‍රිය මනාපය." පේදුරු මේ වචන කතාකරද්දී ම එය ඇසූ සියල්ලන් කෙරෙහි ශුද්ධාත්මයාණන් වහන්සේ පහළ වූ සේක. පේදුරු සමග පැමිණි චර්මඡේදනය ලත් සැදැහැවත්හු විජාතීන් කෙරෙහි ශුද්ධාත්ම දීමනාව පහළ වූ බැවින් මවිත වූහ. ඔවුන් අන්‍ය භෂාවලින් කතාකරන සැටිත්, දෙවියන් වහන්සේගේ මහිමය ප්‍රකාශ කරන සැටිත්, ඔවුනට ඇසිණි. එවිට පේදුරු උත්තර දෙමින්, "අප ලැබුවාක් මෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ ලැබූ ඔවුන් වතුරෙන් බෞතීස්ම-ස්නාපනය කිරීම වැලැක්විය හැක්කේ කවරෙකුට ද"යි කීය. ඔහු ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් ඔවුන් බෞතීස්ම-ස්නාපනය කරන්නට අණ කළේය. එවිට ඔවුහු කීප දවසක් තමන් සමග නැවතී සිටින ලෙස ඔහුගෙන් ඉල්ලූහ.
දේව වාක්‍යය එසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 98:1-4

පිළිතුර: සමිඳාණෝ ස්වකීය ජයග්‍රහණය විජාතීන් හමුවෙහි ප්‍රකාශ කළ සේක.

ගීය; සමිඳුන් හට නව ගීයක් ගයන්න. එතුමාණෝ අසිරිමත් ක්‍රියා කළ සේක. සිය බලයෙන් හා ශුද්ධ ශක්තියෙන් ජයග්‍රහණය ලත් සේක. සමිඳාණෝ ස්වකීය ජයග්‍රහණය ප්‍රකාශ කළ සේක.

විජාතීන්ගේ ඇස් හමුවෙහි සිය විමුක්ති බලය එළිදරව් කළ සේක.
එතුමාණෝ ඊශ්‍රායෙල් වංශය කෙරෙහි එතුමන්ගේ ප්‍රේමයත් විශ්වාසවන්තකමත් සිහි කළ සේක.

මිහිපිට සියලු දෙන අප දෙවිඳුන්ගේ ජයග්‍රහණය දුටුවෝය. එම්බා ලෝ වැසි සියල්ලෙනි, සමිඳුන් හට ප්‍රීතියෙන් ගී ගයන්න. ප්‍රීති ගී ගයමින් එතුමන් පසසන්න.

## දෙවන කියැවීම

1 ජුවාම් 4:7-10

ශුද්ධ වූ ජුවාම් තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**දෙවියන් වහන්සේ ප්‍රේමය වන සේක.**

ප්‍රේමවන්තයෙනි, අපි එක්නෙකාට ප්‍රේම කරමු. මන්ද, ප්‍රේමය දෙවියන් වහන්සේගෙන්ය. ප්‍රේම කරන සැම දෙනම දෙවියන් වහන්සේගෙන් උපත ලබා සිටින බැවින් උන්වහන්සේ අඳුනති. ප්‍රේම නොකරන්නා දෙවියන් වහන්සේ නාඳුනයි. මන්ද, දෙවියන් වහන්සේ ප්‍රේමය ය. අප කෙරෙහි දෙවියන් වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ කරනු ලැබුවේ දෙවියන් වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් අප උන්වහන්සේ කරණ කොටගෙන ජීවත් වන පිණිස, ලෝකයට එවා වදාළ කාරණයෙන් ය. ප්‍රේමය යන්නෙන් මා අදහස් කරන්නේ අප දෙවියන් වහන්සේට ප්‍රේමකිරීම නොව, උන්වහන්සේ අපට ප්‍රේමකර සිය පුත්‍රයාණන් අපේ පාපය නැසීමේ පිළියමක් වශයෙන් එවීමය. දේව වාක්‍යය එසේ ය.

## සාධුකාරය

ජුවාම් 14:23

ආලේලූයා! ආලේලූයා!<br>
යමෙක් මට ප්‍රේම කරන්නේ නම්, හෙතෙම මාගේ ධර්මය පිළිපදින්නේය.<br>
මාගේ පියාණන් වහන්සේ ද ඔහුට ප්‍රේම කරන සේක.<br>
අපි ඔහු වෙතට පැමිණ ඔහු සමග වාසය කරන්නෙමු.<br>
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ජුවාම් 15 :9-17

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**තමාගේ මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවෙකුට නැත.**

පියාණන් වහන්සේ මට ප්‍රේම කළාක් මෙන්ම මම ද ඔබට ප්‍රේම කෙළෙමි. මාගේ ප්‍රේමයෙහි පවතින්න. මා, මාගේ පියාණන් වහන්සේගේ ආඥා පිළිපැද උන්වහන්සේගේ ප්‍රේමයෙහි පවතින සේම, ඔබත් මාගේ ආඥා පිළිපදින්නහු නම්, මාගේ ප්‍රේමයෙහි පවතින්නහුය. මේ දේවල් මා ඔබට ප්‍රකාශ කෙළේ, මාගේ ප්‍රීතිය ඔබ තුළ ඇති වන පිණිසත්, ඔබේ ප්‍රීතිය පරිපූර්ණ වන පිණිසත්ය. මාගේ ආඥාව නම්; 'මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න' යනුයි. යමෙකු තමාගේ මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවෙකුට නැත. මා ඔබට අණ කරන දේ ඔබ කරන්නහු නම්, ඔබ මාගේ මිතුරෝය. මෙතැන් පටන් මම ඔබට දාසයෝ යයි නොකියමි; මන්ද, දාසයෙක් තමාගේ ස්වාමියා කරන්නේ කුමක්දැ යි නොදනියි. එහෙත්, මාගේ පියාණන් වහන්සේගෙන් මා ඇසූ සියල්ලම ඔබට දන්වා වදාළ බැවින්, මම ඔබට මිත්‍රයෝ යයි කීවෙමි. ඔබ මා තෝරාගත්තේ නැත. මම ඔබ තෝරාගෙන පත් කෙළෙමි. එසේ කෙළේ ඔබ ගොස් බොහෝ පල දරන පිණිසත්, ඔබේ පල පවතින පිණිසත්, මාගේ නාමයෙන් ඔබ පියාණන් වහන්සේගෙන් ඉල්ලන කවර දෙයක් වුව ද උන්වහන්සේ ඔබට දෙන පිණිසත්ය. මා ඔබට අණ කරන දේ මෙය: "එකිනෙකාට ප්‍රේම කරන්න."

සුවිශේෂ වාක්‍යය එසේ ය.